විෂය} මව්බස

සතිය- 6

ශ්‍රේණිය:- 5

සැකසුම:- ජී.ඒ.පී.අයිරාගනී මිය, 5 ශ්‍රේණිය බාර ආචාර්ය ර /ඇඹි/කොස්වැටිය විද්‍යාලය

පහත ඡේදය කියවා ඒ ඇසුරින් වගුව පුරවන්න.අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු ලියන්න?

කව්‍යා සැම සති අන්තයක ම සිය මව සමඟ ඔවුන්ගේ ගොවිපළ ට යති. ගොවිපළ ට යන පාර දෙපස විවිධ වර්ගයේ මල් වර්ග වගා කර ඇත. මල්වල පැණි බීමට එන සමනලයින් සහ මී මැස්සන් පාර දෙපස සිටින්නේ කාව්‍යා ත් ඇගේ මව ත් පියා ත් පිළිගැනීමට මෙනි.

තාත්තා උදැල්ල ත් රැගෙන ගිය අතර අම්මා අත පිහියක් සහ යකඩ ඉන්නක් තිබිණි. නිවසින් පිටත් වන විට ම අම්මා වැලිතලප සහ තේ දැමූ උණුසුම් බෝතලයක් මා අතට දුන්නා ය.

ගොවිපළ ට ගිය කාව්‍යා වල් පැළ ගැලවූවා ය.තාත්තා පාත්ති සකස් කළේ ය.අම්මා ළපටි දඹල කඩා ගත්තේ "දඹල සම්බෝලයක් සෑදීමට කදිමයි" යැයි පවසමිනි.

ටික වෙලාවකින් එතනට පැමිණි සරත් මාමා තාත්තා ට බණ්ඩක්කා ඇට පැකට්ටුවක් ලබා දුන්නේ "මල්ලී මම මේවා ගන්නොරුවේ කෘෂි උද්‍යානයෙන් ගෙනාවේ" යැයි කියමිනි. පසුව සරත් මාමා ද තාත්තා ට උදව් කළේ ය.

"මමත් ගිය මාසේ කරවිල,පතෝල,වැටකොළු පාත්ති වගයක් දැම්මා.ඌරන් ගෙන් තමයි පරිස්සම් කර ගන්න ඕනෑ .අපි හොඳ වැටක් ගැහුවා. අපේ පුතා ඒකට මට ගොඩක් උදව් කළා." යැයි සරත් මාමා පැවැසීය.

"අයියේ එන්න අපි තේ බීල ම ඉඳිමු" යැයි යෝජනා කළ අම්මා අපට වැලි තලප දුන්නා ය. වැලිතලප දමා තිබූ බන්දේසිය පැත්තකින් තැබූ අම්මා " තාත්තාටයි මේ මාමාටයි කෝප්ප දෙකක් දෙන්න" යැයි පැවසුවා ය.

අපි සියලු දෙනා ම ගොවිපළට වී වැලිතලප කා තේ බිව්වෙමු.

| | ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |

"අපේ ගෙවත්ත සරු සාරයි" මාතෘකාව යටතේ වචන 05 නොවැඩි වාක්‍ය 05ක් ලියන්න.

1)........................................................................................................

2)........................................................................................................

3)........................................................................................................

4)........................................................................................................

5)........................................................................................................